# සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
# පරිසර අමාත්‍යාංශය

MEPA

# පුරප්පාඩු

**2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ ස්ථාපිත කරන ලද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**රැකියා විස්තරය:**

2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ අධිකාරියට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම.

## 1. අභ්‍යන්තර විගණක (MM 1-1)- තනතුරු 01

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)**

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වාණිජ්‍යය, ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය, ගිණුම්කරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

    සහ

    උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
02. "කනිෂ්ඨ කළමනාකාර" (JM) සේවා ගණයෙහි මූල්‍ය අංශයේ හෝ විගණන අංශයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස:**

අවු.22ට නොඅඩු හා අවු.45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය:**

MM 1-1 : 2025 (රු.91,690 -10X2,480-15X3,450-168,240/=)

## 2. විද්‍යාගාර සහායක (PL 2) - තනතුරු 01

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ගාල්ල විද්‍යාගාරය**

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

1. අදාල විෂය ක්ෂේත්‍රයෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා N.V.Q. දෙවන (2) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. අදාල ක්ෂේත්‍රයෙහි වසර පහක (5) පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාල තනතුරෙහි කාර්යයභාරයට අනුකූල වන, වෘත්තීය පරීක්ෂණයකදී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා N.V.Q. දෙවන (2) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීනතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන PL -1 සේවා ගණයක සේවකයින්.
2. අදාල විෂය ක්ෂේත්‍රයෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා N.V.Q. දෙවන (2) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස:**

අවු.18ට නොඅඩු හා අවු.45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.

**වැටුප් පරිමාණය:**

PL 2 - 2025 (රු.42,300-10X490-10X540-10X590-12X630-66,060/=)

## පොදු:

**01. සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**02. සුදුසුකම් ලබන දිනය:**

සේවයට/තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණි.

**03. පත්වීමේ ස්වභාවය:**

තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදල (EPF) වෙනුවෙන් සේවකයා විසින් ගෙවනු ලබන 10% ට අමතරව අධිකාරියේ 15% ක දායකත්වයක් සහ සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක අමතර දායකත්වයක් ලබා දෙනු ලැබේ.

**04. අයදුම්පත්‍ර එවීම:**

i. අයදුම්කරුවන් තම අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක තනි පැත්තට සකස් කර මුල් පිටුවේ තම පෞද්ගලික විස්තරද, දෙවන පිටුවේ අධ්‍යාපන සුදුසුකම්ද, තෙවන පිටුවේ වෘත්තීය සුදුසුකම් සහ රැකියා පළපුරුද්ද ද, සිව්වන පිටුවේ බාහිර ක්‍රියාකාරකම් ද ඇතුළත් කර ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් සහිතව අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය.

ii. මෑතකදී ලබාගත් චරිත සහතික 2ක්, ග්‍රාම නිලධාරී සහතිකය, පොලිස් වාර්තාව, ජාතික හැඳුනුම්පත, සියලුම අධ්‍යාපන සහතික, වෙනත් සුදුසුකම් සනාථ කරන සහතිකවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා සම්පූර්ණ කළ අයදුම්පත් 2025.09.26 වෙනිදට හෝ ඊට පෙර ලැබෙන පරිදි සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණය සඳහා ජාතික හැඳුනුම්පත සහ ඉහත ඡායා පිටපත් මඟින් ඉදිරිපත් කරන ලද සහතිකයන්හි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

iii. තනතුරු කිහිපයකට අයදුම්කරන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

iv. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.

v. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, අදාළ සහතික වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලෙන් අස්ථානගත වන අයදුම්පත් පිළිබඳ අප අධිකාරිය වගකියනු නොලැබේ.

**සභාපති,**
**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,**
**අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.**
**2025.09.12 වන දින**